# අප රකින වනාන්තර

ශ්‍රී ලංකාවේ ඇති මුළු භූමි ප්‍රමාණයෙන් වනාන්තර වලින් යටව ඇති ප්‍රමාණය සියයට 24. 9 කි. මේ බැව් 1981 මිනුම් දෙපාර්තමේන්තුව විසින් ස්විට්සර්ලන්ත සහාය හා ආධාර ඇතිව කරන ලද ශ්‍රී ලංකාවේ වනාන්තර පිළිබඳ සිතියමකින් හෙළිවේ.

චන්ද්‍රිකා උපයෝගී කරගෙන සකස්කර ඇති මෙම සිතියම අනුව ලංකාවේ මුළු භූමි ප්‍රමාණය වන වර්ග කිලෝමීටර් 66,610 න් වනාන්තර සඳහා යටවී ඇත්තේ 16,318 ක ප්‍රමාණයකි.

**සොබා දහමේ චමත්කාරය: අපරකින වනාන්තර**





1956 වර්ෂයේදී පවත්වන ලද ගුවන් සමීක්ෂණයකට අනුව එකල, ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රමාණය හෙක්ටෙයාර් 2,865,884 කැයිද (අක්කර 7,164,710), ආරක්ෂිත වන ප්‍රමාණය හෙක්ටෙයාර් 1,196,734 කැයිද (අක්කර 2,991,835) නිශ්චය කරනු ලැබිණි. එය අනු පිළිවෙලින් මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 44.1 ක් හා සියයට 18 ක් ද වේ. වර්ෂ 1902 සිට 1956 දක්වා මෙම වනාන්තර ආවාරණයෙහි විශාල වෙනසක් සිදු නොවුවද, 1956 සිට 1972 දක්වා අතරතුර කාලයෙහි නීති විරෝධී ලෙස දුව කැපීම හා කැලෑ එළිකිරීම, විවිධ යෝජනා ක්‍රම ආදිය නිසා ආරක්ෂිත වනාන්තර වලින් සියයට 29 ක්ම අතුරුදහන් වූ බැව් පරීක්ෂණ වලින් හෙළිවිය. මෙය වූ කලී අන්තරාදායක අඩුවීමකි,

මේ කරුණු අනුව සලකා බලන විට, පස සෝදාපාලුව වලක්වන, කෘෂිකර්මය ආරක්ෂා කරන, ගංවතුර ගැලීම අඩු කරන, පිරිසිදු ජලය ලබාදීම සහතික කරන, ප්‍රසන්නතාවය හා විනෝදය ලබාදෙන, පරිසර දූෂණය වලක්වන/අඩුකරන, පරිසරය පරිහානියට එරෙහිව රැකවරන සපයන, කෙටියෙන් කියතොත් මිනිසාගේ සාමාජික, ආර්ථික පාරිසරික ප්‍රගතියට නිශ්චය වශයෙන්ම උපකාරවන වනාන්තර සුරැකුම අපගේ පරම යුතුකම බැව් වැටහෙනු ඇත.

අවුරුදු පණහක් වයස්වූ ගහකින් එම කාලය තුළදී මිනිස් වර්ගයා වෙනුවෙන් ඉටුවූ සේවයේ වටිනාකම රුපියල් 15 ලක්ෂ 70 දහක් යැයි විද්‍යාඥයෝ ගණන් හිලවු දක්වති.